**පොතුවිල් ප්‍රාදේශීය සභාව**
**අම්පාර දිස්ත්‍රික්කය**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2016 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 මාර්තු 24 දිනද, ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 10 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, 2016 වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2017 සැප්තැම්බර් 29 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට පොතුවිල් ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 විගණන සාක්ෂි නොවීම්

මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති පහත සඳහන් එක් එක් ගිණුම් විෂයය ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

| විෂයය | වටිනාකම | ඉදිරිපත් නොකළ සාක්ෂි |
|---|---|---|
| | රු. | |
| ගොඩනැගිලි | 4,622,148 | ස්ථාවර වත්කම් ලේඛනය |
| පුස්තකාල පොත් | 74,456 | පුස්තකාල පොත් ලේඛනය |

#### 1.3.2 නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම

පහත දැක්වෙන නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම් අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.12 මාර්ගෝපදේශය | ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන්ට ගෙවනු ලබන එකතු කළ අගය මත බදු පිළිබඳ විස්තර එළඹෙන මාසයේ 15 වැනි දිනට පෙර විගණකාධිපතිටද පිටපතක් සහිතව දේශීය ආදායම් කොමසාරිස්වරයාට යැවිය යුතු වුවද, 2014 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා කොන්ත්‍රාත්කරුවන්ට ගෙවනු ලැබූ රු.2,581,477 ක් වටිනා එකතු කළ අගය මත බදු පිළිබඳ විස්තර එලෙස දැනුම් දී නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 571 මුදල් රෙගුලාසිය | රු. 2,192,000 ක් වටිනා වර්ෂ 02 ක් ඉක්ම වූ තැන්පතු 94 ක් අදාළ පුද්ගලයින්ට ආපසු ලබාදීමට හෝ ආදායම් ගිණුමට මාරු කිරීමට හෝ කටයුතු කර නොතිබුණි. |
| (ඇ) | 2014 ඔක්තෝබර් 17 දිනැති අංක 02/2014 දරන රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛය | සමාලෝචිත වර්ෂය සඳහා භාණ්ඩ සමීක්ෂණ වාර්තාව 2017 මාර්තු 17 දිනට පෙර විගණකාධිපතිවරයාට ඉදිරිපත් කළ යුතු වුවත්, එම වාර්තාව 2017 අගෝස්තු 16 දින වන විටත් ඉදිරිපත් කර නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිඵලය රු.7,062,954 ක පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායමක් විය. එයට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.15,846,919 ක් ව තිබූ හෙයින් මූල්‍ය ප්‍රතිඵලයේ රු. 8,783,965 ක පිරිහීමක් පෙන්නුම් කෙරුණි.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 වරිපනම් හා බදු

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වගන්තිය ප්‍රකාරව, සභා බල ප්‍රදේශයට අයත් ප්‍රදේශවල ඇති ව්‍යාපාරික ස්ථාන 656 ක සහ නිවාස 9,983 ක් මත 2003 වර්ෂයේ සිට වරිපනම් තක්සේරු කර අයකිරීමට කටයුතු නොකිරීම හේතුවෙන් වාර්ෂිකව ආසන්න වශයෙන් රු.5,319,500 ක ආදායමක් අහිමි වෙමින් පැවතුණි.

#### 2.2.2 ප්‍රචාරක දැන්වීම් පුවරු සඳහා ගාස්තු අයකිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය ප්‍රකාරව, සභා බල ප්‍රදේශයට අයත් ප්‍රදේශ තුළ පුද්ගලික ආයතන විසින් ඔවුන්ගේ විකුණුම් ද්‍රව්‍ය ප්‍රචාරණය කිරීම සඳහා ස්ථාපිත කළ දැන්වීම් පුවරු 40 කින් අයකර ගත යුතු රු.208,200 ක් 2017 අගෝස්තු 16 දින වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

#### 2.2.3 මස්කඩ බදු අයකිරීම

1992 වර්ෂයේ සිට 2011 වර්ෂය දක්වා හිඟහිටව පැවැති මස්කඩ බදු මුදල් රු.1,676,063 ක් අයකර ගැනීමට සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් කටයුතු කර නොතිබුණි.

#### 2.2.4 ගව හම් විකුණුම් ආදායම

සභාවේ ගව ඝාතකාගාරයේ මස් පිණිස වාර්ෂිකව ආසන්න වශයෙන් ගවයින් 3600 ක් ඝාතනය කර තිබුණු නමුත් එම ගවයින් සම්බන්ධයෙන් ගව ඝාතන ගාස්තු අයකර ගැනීම සහ ඒවායේ සම්, සම් භාණ්ඩ නිෂ්පාදනය කරන නිෂ්පාදන ආයතනවලට විකිණීමට කටයුතු කර නොතිබීම හේතුවෙන් සභාව විසින් වාර්ෂිකව ආසන්න වශයෙන් රු.900,000 ක මුදලක් අහිමි කරමින් තිබුණි.

**2.2.5 කඩ කාමර කුලී අයකිරීම**

1995 වර්ෂයේ සිට 2005 වර්ෂය දක්වා හිඟහිටව පැවැති කඩකුලී ගාස්තු රු.32,667 ක් 2017 අගෝස්තු 16 දින වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**2.2.6 තානායම් සේවා ගාස්තු**

1987 වර්ෂයේ අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වගන්තිය ප්‍රකාරව, සභා බල ප්‍රදේශයේ පිහිටා ඇති සංචාරක බංගලා 117 කින් ලැබෙන ආදායමෙන් සියයට 0.1 ක බදු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**කළමනාකරණ අකාර්යක්ෂමතා**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයෙන් සහ ව්‍යාපෘතිවලින් සභාව විසින් ලබාගෙන තිබූ වාහන 07 ක් වර්ෂ හතරක කාලයක සිට භාවිතා කරමින් පැවතුණද, එම වාහනවල අයිතිය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය සඳහා වන වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල නිර්දේශ මත වර්ග 15 කට අයත් භාණ්ඩ 156 ක ඌනතා, විනාශ කළ යුතු පුස්තකාල පොත් 2000 ක් සහ විකිණිය යුතු පුස්තකාල පොත් 144 ක් සම්බන්ධයෙන් 2017 අගෝස්තු 16 දින වන විටත් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

**3.2 කොන්ත්‍රාත් පරිපාලනය**

**3.2.1 අභ්‍යන්තර මාර්ගවලට බොරළු ඇතිරීම**

2015 වර්ෂයේ ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ වැඩසටහන යටතේ සභා බල ප්‍රදේශයට අයත් අභ්‍යන්තර මාර්ග 05 කට බොරළු ඇතිරීම සම්බන්ධයෙන් 2016 වර්ෂයේදී බොරළු කියුබ් 440 ක් සඳහා රු.1,100,000 ක මුදලක් ගෙවීම් කර තිබුණි. එසේ වුවද, තාක්ෂණික නිලධාරීන්ගේ සහ වැඩ සුපරීක්ෂකවරුන්ගේ ලිඛිත තහවුරු කිරීම් අනුව එම මාර්ගවලට බොරළු කියුබ් 297 ක් පමණක් අතුරා ඇති බව දක්වා තිබුණි. මේ අනුව, රු.357,500 ක් වැඩියෙන් ගෙවා තිබුණි.

**4. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය**

**4.1 නිරවුල් නොකළ විගණන ඡේද**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2011 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා වන කාලපරිච්ඡේදය සඳහා සභාවේ සේවය කළ සේවකයින් 04 දෙනෙකුගෙන් වැඩියෙන් අයකරගෙන තිබුණු ණය වාරික රු.48,554 ක් 2017 අගෝස්තු 16 දින වන විට ගෙවා නිරවුල් කර නොතිබුණි.

(ආ) සභාවේ ආදායම් වැඩිකිරීම සහ රැකියා අවස්ථා ලබාදීමේ අරමුණින් World Vision ආයතනයෙන් 2008 වර්ෂයේදී රු.1,231,600 ක මුදලක් සහ 2011 වර්ෂයේ සභාවේ අරමුදල් රු.1,612,127 ක් උපයෝගී කරගෙන කඩදාසි ප්‍රතිචක්‍රීයකරණය කිරීමේ මධ්‍යස්ථානයක් ඉදිකර තිබුණත් මේ දක්වා භාවිතා කර නොතිබීම හේතුවෙන් එය විනාශයට පත් වී තිබුණි.

(ඇ) ස්ථාන මාරු වී ගිය සහ සේවය හැර ගිය සේවකයින් 07 දෙනෙකුට ප්‍රාදේශිය සභාව විසින් ලබා දී තිබූ රු.396,758 ක ණය ශේෂ වර්ෂ 04 ක සිට වර්ෂ 16 කට අධික කාලයක් දක්වා අයකර ගෙන නොතිබුණි. මෙම ණය ශේෂ අදාළ ඇපකරුවන්ගෙන් අයකර ගැනීමට හෝ ඔවුන්ට විරුද්ධව නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට හෝ 2017 අගෝස්තු 16 දින වන විටත් කටයුතු කර නොතිබුණි.

**5. පද්ධති හා පාලන**

------------------

පහත දැක්වෙන එක් එක් ක්ෂේත්‍ර හා ඒ ඉදිරියේ දක්වා ඇති කරුණු කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කළ යුතුව ඇත.

| පාලන ක්ෂේත්‍රය | විශේෂ අවධානය යොමුකළ යුතු කරුණු |
|---|---|
| (අ) ස්ථාවර වත්කම් | i ස්ථාවර වත්කම් ලේඛනය පවත්වා ගැනීම.<br>ii නිෂ්කාර්යව පවතින වත්කම් ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කිරීම. |
| (ආ) ආදායම් අයකිරීම් කළමනාකරණය | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කිරීම. |
| (ඇ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය | ඝන අපද්‍රව්‍ය වෙන්කර එකතු කිරීම. |